# වත්තල පැරණි තොටුපල සහ වෙළඳපල

**සානා මේධාලි රණසිංහ**

සහකාර කථිකාචාර්ය, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

shanamedhali@gmail.com

## හැඳින්වීම

ජලාශ්‍රිත ප්‍රවාහන සහ භාණ්ඩ සංසරණ කටයුතු සඳහා යොදා ගන්නා, සමුද්‍ර හෝ ගංගා ඉවුරුවල පිහිටි කුඩා පරිමාණ මධ්‍යස්ථාන තොටුපල (Port) ලෙස හැඳින්වේ. මෙම පර්යේෂණ පත්‍රිකාව හරහා ශ්‍රී ලංකාවේ තොටුපලවල් අතරින් අප්‍රකට ව පවතින වත්තල තොටුපල සහ ඒ හා සම්බන්ධ ව පවතින්නට ඇතැයි විශ්වාස කරන වෙළඳපල හෝ වෙළඳ නගරය පිළිබඳ අධ්‍යයනයක් සිදුකිරීම අරමුණු කෙරේ. මෙම පර්යේෂණය සඳහා ලිඛිත මූලාශ්‍රය මෙන් ම ක්ෂේත්‍රගත අධ්‍යයනයන් ද යොදාගනු ලැබිණි. එම ක්‍රමවේදයන් හරහා වත්තල තොටුපල සහ වෙළඳපල සම්බන්ධයෙන් ඓතිහාසික සහ පුරාවිද්‍යාත්මක සාධක පවතින බවත් අධ්‍යයන පවසරිය තුළ පුරාවිද්‍යාත්මක අවශේෂවලින් බහුතරයක් අප්‍රකට තත්ත්වයේ පවතින බවත් අනාවරණය කරගනු ලැබිණි.

## ස්ථානීය පිහිටීම සහ භූ විද්‍යාත්මක පසුබිම

කොළඹ - මීගමුව මහා මාර්ගයෙහි 5 වන සැතපුම් කණුව ආසන්නයෙන් වම්පසට දිවෙන ශ්‍රී වික්‍රම මාවත අවසානයේ කැලණි ගඟෙහි මුවදොරට ඉහළණි වම් ඉවුරෙහි බැවුම් සහිත කලාපයක වත්තල තොටුපල පැවති බවට සාධක වේ. පහතරට තෙත් කලාපයට අයත් බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ වත්තල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය හෙවත් පැරණි බෙදීම්වලට අනුව අලුත්කුරු කෝරලයේ රාගම් පත්තුවේ නිරිතදිග තැනිතලා ප්‍රදේශය මෙම අධ්‍යයනයට මූලික වශයෙන් ම බඳුන් විය. තොටුපලට අයත් ව පැවැති භූමිය වර්තමානයේ වත්තල ඇවරිවත්ත ග්‍රාම නිලධාරී වසමට (175-B) අයත් වන අතර පැරණි වෙළඳපල පිළිබඳ සාධක මෙම කලාපය පුරා ම ව්‍යාප්ත ව පවතියි.

## ඓතිහාසික පසුබිම

වත්තල තොටමුණක් පිළිබඳ ප්‍රථම වක්‍ර සාධක අනුරාධපුර රාජධානි සමයට අයත් වේ. වංකනාසික තිස්ස රජුගේ පුත් වූ ගජබාහු රජු තම පියාගේ රාජ්‍ය සමයෙහි ඉන්දියාවට ගෙන ගිය සිංහල මිනිසුන් වහල්කමින් මුදාගෙන, සොළී 12,000 ක් ද ශ්‍රී ලංකාවට ගෙන ආ බව මහාවංසයෙහි සඳහන් වේ. මෙලෙස ගෙන ආ ද්‍රවිඩයන් අලුත්කුරු කෝරලය සහ තවත් ප්‍රදේශ කිහිපයක පදිංචි කරවා තිබේ. මෙම අලුත්කුරු කෝරලය යනු පැරණි බෙදීම්වලට අනුව වත්තල අයත් වූ කලාපය ය. ඒ අනුව මුහුදු මාර්ග ඔස්සේ ශ්‍රී ලංකාවට ඇතුළුවීමේ දී රට අභ්‍යන්තරයට ගමන් කිරීම සඳහා මෙම තොටුපල භාවිත කරන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය.

ඓතිහාසික වශයෙන් තොටුපල සහ වෙළඳපල පිළිබඳ ව මෙන් ම ඒ අවට කලාපයෙහි ආර්ථිකමය හා ඌකියාමය පසුතලය පිළිබඳ තොරතුරු ප්‍රථමවරට ඉස්මතු වී ඇත්තේ ගම්පල, පස්වෙනි බුවනෙකබාහු (ක්‍රි. ව. 1372-1407) රාජ්‍ය සමයේ දී ය. මයූර සන්දේශයෙහි මෙම ප්‍රදේශය පිළිබඳ ව සඳහන් ව ඇති තොරතුරුවලට අනුව ක්‍රමයෙන් දියුණුවෙමින් පැවති කොළඹ වරායත්, එකල ප්‍රකට වෙළඳ මාර්ගයක් වූ කැලණි ගංගාවත් වත්තල ග්‍රාමයට ආසන්න ව පැවත තිබේ.

උතුරේ සිට දකුණු කොළඹ වරාය දක්වා තිබුණු මාර්ගයත්, සීතාවක දෙසින් පැමිණි මාර්ගයත්, කැලණි ගග හරහා ගමන් කර ඇත්තේ වත්තල තොටුපලිනි. ආර්ය චක්‍රවර්තීන් වෙනත් තොටුමුණු හයක් සමග වත්තල තොටමුණ අල්ලාගෙන ඇති අතර ඒ හරහා වත්තල තොටුපලක් ලෙස වැදගත් වීමේ සාධනීය අවස්ථා පෙන්නුම් කෙරේ. ආර්ය චක්‍රවර්තීන් අයබදු ලබාගැනීමට වත්තල තානායම් පලක් පිහිටුවා ද්‍රවිඩ සේවාවක් නවත්වා තිබූ බවත් නිශ්ශංක අලගක්කෝනාර ඔවුන් පරාජය කොට සිංහල සේනාවක් නවතන ලද බවත් නිකාය සංග්‍රයෙහි සඳහන් වේ. හංස සන්දේශයට වත්තල තොටුපල නිරතුරු ව කාර්ය බහුල ව පැවත ඇති අතර එය වෙළඳුන්ගේ හා ඔරු පාරුවලින් පිරුණු සුවිශාල පටුනක් ව තිබේ. කෝකිල සන්දේශ කතුවරයා සහ තිසර සන්දේශ කතුවරයා ද සිය කෘතීන් හි වත්තල 'අලුත් තොටුපල' වර්ණනා කර තිබේ. ක්වේරෝස් දක්වා ඇති තොරතුරුවලට අනුව සිංහල රජවරු සහ පෘතුගීසි සෙනෙවියන් උනුන් පරයා වත්තල පෙදෙස තමන් නතු කර ගැනීමට උත්සහ කර තිබේ. තව ද මෙම තොටුපල පෘතුගීසි පරිපාලන වකවානුවෙහි වැදගත් වූ බව ජෝආඩ් රොබෙයිරෝ, ක්වේරෝස් සහ එමර්සන් ටෙනන්ට්ගේ වාර්තාවල සඳහන් වේ. සමකාලීන පෘතුගීසි වාර්තාවල මෙම තොටුපල 'බෙතාල්' ලෙස හඳුන්වා තිබේ. ඉංග්‍රීසින්ගේ පාලන සමයෙහි උඩරට අවසන් රජු වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ඉන්දියාවට ගෙන යාම සඳහා රඳවා තබා ඇත්තේ ද මෙම තොටුපලෙහි ය.

## පුරාවිද්‍යාත්මක සාධක

1960 දශකයේ සෙනරත් පරණවිතාන මහතාගේ ගවේෂණයන්ගෙන් වත්තල තොටුපල ආසන්නයේ කොහු කර්මාන්ත ශාලාවකට අයත් භූමියෙහි හෑරීමකින් දිරා ගිය ඇත්දළ කැබලි රාශියක් ගොඩ දමා තිබේ. ඒ අනුව පෘතුගීසි සහ ඉංග්‍රීසි වාර්තාවල සඳහන් වන ඇත්ගාල මෙම ස්ථානයේ පවතින්නට ඇති බව ද තොටුපල හරහා විදේශයන්ට ගෙන ගිය ඇතුන් ගාල් කිරීමට මෙම ස්ථානය භාවිත කරන්නට ඇති බව ද පෙනේ. වඩදිය බාදිය උස්පහත්වීම් සිදුවන දිනයන්හි (විශේෂයෙන් ම පොහෝ දිනවල) පැරණි තොටුපලට අයත් ජැටියක කොටස් හඳුනාගනු ලැබිණි. මෙම තොටුපලට ආසන්නයේ ගංගා මුවදොර ආසන්නයේ උමගක සාධක ද හඳුනාගනු ලැබිණි. නමුත් මෙහි උපයෝගීතාවය අපැහැදිලි ය. ගම්පල යුගයේ තොටුපලෙහි පරිපාලන සහ ආරක්ෂක කටයුතු සඳහා සිටි හමුදාවන්ගේ සංස්කෘතික අවශේෂ සහිත කලාපයක් ද මෙහි දී හඳුනාගනු ලැබිණි. තොටුපල ආසන්නයෙන් පැහැදිලි ලෙස යටත්විජිත වකවානුවලට සමකාලීන වන සාධක ද හඳුනාගැනිණි. දියෝගෝ ද මේලෝ සෙනෙවියා සහ කුරුප්පු මුදලි අතර පැවති සටනින් තමන් ලබා ගත් ජයග්‍රහණය සිහිකිරීමට පෘතුගීසින් විසින් දේවස්ථානයක් ඉදිකරනු ලැබ තිබේ. ක්වේරෝස්ගේ ග්‍රන්ථයට අනුව මෙම දේවස්ථානය ඉදිකර ඇත්තේ තොටුපලට ඉතා සමීප ව ය. ලන්දසීන් මුහුදුබඩ අල්ලා ගැනීමෙන් පසු ව එම දේවස්ථානය බිඳ දමා ඇති අතර, පසුව එය (1830) කතෝලික සොහොන් බිමක් බවට පත් ව තිබේ. වත්තල ගල්වැටිය මාර්ගයෙහි කෙළවර තොටුපල සමීපයෙහි පැරණි සොහොන් පිටියෙහි හා දේවස්ථානයෙහි කොටස් දක්නට ලැබුණු අතර, වර්තමානයේ එම භූමියෙහි නව ඉදිකිරීම් දක්නට ලැබේ. පැරණි සොහොන්බිමෙහි තිබුණු මරියතුමියගේ ප්‍රතිමාව වර්තමාන කොළඹ මීගමුව මාර්ගයෙහි, ගල්වැටිය මාර්ගය අසල දක්නට ලැබේ.

## නිගමනය

අනුරාධපුර යුගයෙහි පටන් ජනාවාසකරණයට බඳුන් වී ඇති වත්තල සහ ඒ අවට භූමිභාගයෙහි භූගෝලීය වැදගත්කම මත වෙළඳාමට සහ භාණ්ඩ සංසරණයට සුදුසු පසුබිමක් නිර්මාණය වී තිබේ. ඉන්දියානු සාගරය සහ කැලණි ගංගාව එක් වන ගං මුවදොරෙහි පිහිටියා වූ මෙම තොටුපල ආශ්‍රිත ව වෙළඳපලක් පැවති බවට ද සාධක වේ. අටවන වීරපරාක්‍රමබාහු රජු කැලණි ගං මුවදොරෙහි සිට උතුරු දිශාවට, ඉන්දියන් සාගරයට සමාන්තර ව ඇල මාර්ගයක් තැනීම ආරම්භ කර ඇති අතර එම ඇල මාර්ගය තැනීමට හේතුවන්නට ඇත්තේ ද ආර්ථිකමය අවශ්‍යතාවන් බව පෙනේ. ලන්දේසීන් යටතේ සංවර්ධනය කළ සහ නිර්මාණය කළ අභ්‍යන්තර ඇල මාර්ගයන් ද ඉහත කරුණු සාධනය කිරීමට යොදා ගත හැකි ය. වත්තල

ප්‍රදේශයේ සිදු කළ ගවේෂණයන්ගෙන් 1960 දශකයේ තොටුපල සහ වෙළඳපල පිළිබඳ සාධක හමු වී ඇතත් එම දත්තවල සහසම්බන්ධය හඳුනාගෙන නොමැත. මෙම පර්යේෂණය හරහා පුරාවිද්‍යාත්මක ව වැදගත් වන නව සාධක කිහිපයක් හඳුනාගත් අතර පූර්ව පර්යේෂණ වාර්තා ද ඓතිහාසික සහ පුරාවිද්‍යාත්මක සාධක ද යොදා ගෙන වත්තල තොටුපල සහ ඒ ආශ්‍රිත වෙළඳ ක්‍රියාකාරකම් තහවුරු කරගනු ලැබිණි.

### ආශ්‍රෙය ග්‍රන්ථ


මයුර සංදේශය., 1998. කේ. ඩී. පී. වික්‍රමසිංහ (සංස්.) ණී ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

මහාවංසය., 1946. බටුවන්තුඩාවේ පණ්ඩිත හා හික්කඩුවේ සුමංගල හිමි. (සංස්.) කොළඹ.

වත්තල, එස්., 1999. වත්තල පුරාණය, සුරවීර, ඒ. වී. ගම්පහ සමාජ සංස්කෘතික සමීක්ෂා, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

Fernando, B., 1994. The Village at the mouth of the River, English Writer's Cooperative of Sri Lanka, Colombo.